**<u>ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයේ පවත්වන සංස්කෘතික අධ්‍යාපන වැඩ පිළිවෙලට අදාළ කොන්දේසි මාලාව</u>**

# සාමාන්‍ය තත්වයන් යටතේ දහම් පාසල පැවැත්වීම

(කොන්දේසි මාලාව මෙම අධ්‍යයන වසර සඳහා සංශෝධනය කර ඇති අතර නැවත දැනුම්දෙන තුරු මේ හා සබැඳි විශේෂ කොන්දේසි මාලාවටද සමාන ප්‍රමුඛත්වය හිමිවන බව සැලකිය යුතු වේ.)

1. සිකුරාදා දිනවල පහත සඳහන් වෙලාවන් තුළ පන්ති පැවැත්වෙනු ඇත.
   - හතර (4) වසර සිට අට (8) වසර දක්වා පන්ති - පෙ.ව 7.55 සිට දහවල් 11:50 දක්වා,
   - එක (1) දෙක (2) වසර සහ තුන (3) වසර පන්ති - දහවල් 12.25 සිට ප.ව 4:10 දක්වා,

   ඉහත සඳහන් කාල වේලාවන් ට අනුකූලව දරුවන් රැගෙන ඒම සහ රැගෙන යාම දෙමාපිය භාරකරුවන්ගේ වගකීමකි. **<u>ප.ව. 4:10 න් පසු</u>** කොන්සල් ජනරාල් කාර්යාලය සහ එම පරිශ්‍රයේ දරුවන් කිසි විටෙකදී රැඳී නොසිටිය යුතු අතර එසේ ගැවසෙන දරුවන්ගේ සම්පූර්ණ වගකීම දෙමාපියන් සතුවනු ඇත. වසරක් පාසා ඇතුලත් වන දරුවන් සංඛ්‍යාවන් අනුව ඉහත කාලවේලාවන් වෙනස් විය හැක.
2. දහම්පාසලට දරුවකු ඇතුළු කිරීම සඳහා එම දරුවා 2020 දෙසැම්බර් මස 31 වැනිදාට වයස අවුරුදු හය (6) සම්පූර්ණ වී තිබිය යුතුය. එනම් 2014 දෙසැම්බර් මස 31 දින හෝ එදිනට පෙර උපන් දරුවෙක් විය යුතුය.
3. **2** වසර සහ **3** වසර පන්ති සඳහා දරුවන් ඇතුළත් කිරීමක් සිදු **<u>නොකෙරෙන</u>** බව කරුණාවෙන් සලකන්න.
4. හතර (4) වසර සහ ඉන් ඉහළ පන්ති වලට දරුවන් ඇතුළත් කිරීම සඳහා සිංහල, බුද්ධාගම සහ අපේ උරුමය විෂයයන් ආශ්‍රිතව සරල ලිඛිත සහ වාචික පරීක්ෂණයක් පවත්වනු ලබන අතර එයින් ලබාගන්නා ප්‍රතිඵල අනුව දහම් පාසලේ සංවිධායක කමිටුවේ අනුමැතිය මත දරුවන් සුදුසු පන්තිවලට අනුගත කරනු ලැබේ. එම දරු දැරියන්ගේ වයස 2020 දෙසැම්බර් මස 31 වැනිදාට අවුරුදු නමය (9) සම්පූර්ණ වී තිබිය යුතුය.
5. පිරිමි දරුවන් කොණ්ඩය කොටට කපා මනාව පීරා, සුදු පැහැති ජාතික ඇඳුමෙන් සැරසිය යුතු වන අතර අත් කොට කමිස හෝ අනෙකුත් ඇඳුමින් සැරසී නොපැමිණිය යුතුය. ගැහැණු දරුවන් පිට සහ කර ප්‍රදේශයන්, නාභිය සහ උදරය මනාව වැසෙන සේ සකසන ලද සුදු පැහැති වාම් ළමා සාරියකින් සැරසී, කොණ්ඩය කරල් දෙකකට වනසේ ගොතා සුදු පැහැති රිබන් පටි වලින් මනා ලෙස බැඳ පාසලට පැමිණිය යුතු වේ.
6. අධ්‍යාපන කටයුතු සාර්ථකව කරගෙන යෑම සඳහා දරුවන් දිනපතා පාසලට පැමිණීම අත්‍යවශ්‍ය වනු ඇත. අධ්‍යයන වසර ඇතුළත දහම් පාසල පැවැත්වෙන දින ප්‍රමාණයෙන් 70% කට වැඩියෙන් සහභාගී වන දරු දැරියන් හට පමණක් වර්ෂ අවසාන පරීක්ෂණයට ඉදිරිපත් විය හැකි බවත්, ඒ අනුව ඉහළ පන්තියට අනුගත කිරීම සිදු කෙරන බවද කරුණාවෙන් සලකන්න.
7. කිසිම දැනුම් දීමකින් තොරව නොකඩවා දින තුනක් (3) පාසලට නොපැමිණෙන දරුවන් පාසල හැර ගියාසේ සලකනු ඇත. ඔබ විසින් පෙර දැන්වීමක් කලද එය අප දහම් පාසලේ කොන්දේසි මාලාවේ 6 වැනි කොන්දේසිය සම්පූර්ණ වීමක් නොවන බව කරුණාවෙන් සලකන්න. එම දරුවන් නැවත පාසලට ඇතුළත් කරවීමට අවශ්‍යනම් මීළඟ පාසල් වාරයේදී අලුත් ඉල්ලුම් පතක් ඉදිරිපත් කළ යුතුය.
8. පාසල නොපවත්වන දින, විශේෂ අවස්ථාවන් පිළිබඳව සහ වෙනත් පුහුණු කිරීම් කටයුතු, නිවේදන පිළිබඳව පූර්ණ දැනුම් දීමක් දෙමාපියන් වෙත කෙරෙනු ඇත. එවන් අවස්ථාවන් පිළිබඳව දැනුම් දීම සඳහා ඉල්ලුම් පත්‍රයේ සඳහන් දුරකථන අංක, අන්තර්ජාල ලිපිනයන් ප්‍රයෝජනයට ගන්නා අතර එම දත්තයන්ගේ වෙනස්වීම් නොපමාව සංවිධායක කමිටුව වෙත දැනුම් දීම දෙමාපියන්ගේ වගකීම වනු ඇත. දෙමව්පියන් සමග සංනිවේදනය කිරීමට වඩාත් උචිත සහ වඩාත් පහසුදායී තොරතුරු තාක්ෂණ මාධ්‍යයන් භාවිතා කරන අතර ඒ සමගින් සහභාගී වීමට යම් දෙමව්පියෙකු අකමැතිනම් ඒ බව සංවිධායක මණ්ඩලය දැනුවත් කල යුතුය.
9. දූ දරුවන් වෙලාවට රැගෙන ඒම, රැගෙන යාම සහ වැඩසටහන් පැවැත්වෙන වේලාවන් තුළ කොන්සල් ජනරාල් කාර්යාල පරිශ්‍රය තුළ හෝ ඒ අවට අනවශ්‍ය ලෙස ගැවසීමෙන් සහ රැස්වීමෙන් වැළකිය යුතුය.



Sri Lanka Consulate General Office, No. 2, Street 322-B, Al Hudaiba, Dubai, UAE. Postal: PO Box 51528, Dubai, UAE.
TP. +971 4 3986535, Fax: +971 4 3984687, E Mail: dahampasaladubai@gmail.com, Web: http://www.dhahampasala.org

10. දෙමාපියන් තමන්ගේ වාහන කොන්සල් ජනරාල් කාර්යාලයට යාබද මාර්ග වලට (අමුණුම 1) අවතීර්ණ නොකර වෙනත් නීත්‍යානුකූලව නතර කළ හැකි ස්ථානයන්හි නවතා පාසලට දරුවන් රැගෙන ඒම සහ රැගෙන යාම කළ යුතුය. මෙම කොන්දේසිය සතියේ දිනයන් හි පැවැත්වෙන අතිරේක පංති, පුහුණුකිරීම් කටයුතුවලට සහභාගී වීමේදීද ක්‍රියාත්මක කළ යුතුය.

11. පදික වේදිකාව මත හෝ ද්විත්ව මාර්ග නවතන (double lane parking) කොට හෝ අනෙකුත් නිවෙස් ඉදිරිපිට දරුවා එනතෙක් වාහනය නවතාගෙන සිටීම සපුරා තහනම් බව සැලකිය යුතුයි.

12. දහම් පාසල පවත්වාගෙන යාමට මොනයම් ආකාරයකින් හෝ තර්ජනයක් වන අන්දමේ ක්‍රියාකාරකම් නොකිරීමට සැමවිටම වග බලා ගත යුතු අතර දහම් පාසලේ පැවැත්ම සහ උන්නතිය සඳහා උපකාර කිරීම දෙමව්පියන්ගේ අනිවාර්ය වගකීමක් වනු ඇත.

13. තම වාහන නැවත්වීමේදී කොන්සල් ජනරාල් කාර්යාල භූමිය අවට නිවැසියන් හට අවහිරයක්, අපහසුතාවයක් නොවන අයුරින් කටයුතු කළ යුතුය. දරුවන් වාහනයෙන් බැස්වීම හෝ නැංවීම සඳහා මාර්ගය අවහිර වනසේ වාහන නවත්වන අවස්ථාවන් හිදී ඒ පිළිබඳව ක්‍රියා කිරීමට අදාළ නිලධාරින් හට දැනුම් දී නීතිමය පියවර ගැනීමට සිදුවනු ඇත.

14. දහම් පාසල අසල සිසුන් හැසිරවීම, වාහන හැසිරවීම, නීති උල්ලංඝනය කරන්නන්ගේ විස්තර ලබා ගැනීම, ආදියෙහි වගකීම දෙමාපිය කමිටුව හෝ දහම් පාසල විසින් පත්කරන ලද නිලධාරීන් සතු වන අතර තම වාහනය නිසි ලෙස නවතා දරුවන් රැගෙන ඒම / යාම සිදුකරමින් එම කටයුතු සඳහා සම්පූර්ණ සහයෝගය ලබා දීම දෙමාපියන්ගේ යුතුකමක් වනු ඇත.

15. දූ දරුවන්ට අවශ්‍ය පරිදි විවේක කාලයේදී අනුභවය සඳහා නිර්මාංශ සුළු ආහාරයක් සහ සුදුසු බීමක් නිසි ලෙස සකස් කොට සුරක්ෂිතව අසුරා එවීම දෙමව්පියන් ගේ වගකීමක් වනු ඇත. එම පාර්සල් වල අනිවාර්යයෙන් දරුවාගේ නම සඳහන් කළ යුතුය.

16. දහම් පාසල මගින් පවත්වන විවිධ වැඩසටහන් වලට සහභාගී වන දූ දරුවන් ගේ ඡායාරූප, වීඩියෝ පට සහ හඬ පට විවිධ මාධ්‍යයන් ඔස්සේ දහම් පාසල මගින් ප්‍රචාරය කිරීම පිළිබඳව කිසියම් විරෝධයක් නොමැති විය යුතුයි.

17. දරුවාගේ සෞඛ්‍යය හෝ හැසිරීම් රටාව සම්බන්ධයෙන් දහම් පාසල දැනගතයුතු විශේෂ කරුණු (ආසාත්මිකතා - allergies, ආබාධිත තත්වයන් - special needs, විශේෂ හැසිරීම් රටා) වෙතොත් එය අදාල ගුරුවරුන් දැනුවත් කිරීම සඳහා සංවිධායක කමිටුව වෙත දැනුම්දිය යුතුයි.

18. දෙමව්පියන් දහම් පාසලට දරුවන් රැගෙන එන විට සුදුසු වාම් ඇඳුමකින් සැරසී පැමිණිය යුතුයි. සුදු පැහැති ඇඳුමකින් සැරසී දහම් පාසලට පැමිණීම වඩාත් සුදුසු බව සලකන්න

19. දහම් පාසලේ සංනිවේදන සඳහා හැකිතාක් දුරට නිතර භාවිතා කරන <u>පුද්ගලික</u> විද්‍යුත් තැපැල් (e-mail) ලිපිනයක් ලබාදීමට කටයුතුකළ යුතුය. මෙම ලිපිනයන් වෙත පණිවිඩ එවීම දහම් පාසලේ කමිටුවේ අධීක්ෂණය යටතේ සිදුකරන බව සලකන්න. දහම් පාසලේ සංවිධායක මණ්ඩලය විසින් සුදුසුයයි තීරණය කරන දහම් පාසලේ දැන්වීම් සහ බාහිර වැඩසටහන් පිළිබඳව දැන්වීම් ද මෙම ලිපිනයන් වෙත එවන අතර, බාහිර දැන්වීම් ලබාගැනීමට අවශ්‍ය නොමැතිනම් ඒ බව සංවිධායක කමිටුව දැනුවත් කල යුතුය.

20. දහම් පාසලේ ගුරුවරුන් විසින් දරුවන් සහ දෙමාපිය දැනුවත් කිරීමේ කෙටි පණිවිඩ සඳහා WhatsApp පසුකම පන්ති මට්ටමින් උපයෝගී කිරීමට සහයෝගය ලබාදිය යුතු අතර, ඒ සඳහා වූ උපදෙස් මාලාව පිළිපැදීමට සැමවිටම කටයුතු කල යුතුය.

21. දහම් පාසල පවත්වාගෙන යාමට තර්ජනයක් වන අන්දමින් කොන්සල් ජනරාල් කාර්යාල භූමිය තුළ සහ අවට ප්‍රදේශය තුළ කිසිම ආකාරයක වෙළඳ ප්‍රචාරක පත්‍රිකා බෙදාහැරීම හෝ ඒ හා සම්බන්ධ කටයුතු සඳහා සහභාගීවීමෙන්, අනුබල දීමෙන් හෝ අනුග්‍රහය දැක්වීමෙන් වැළකිය යුතුය.



Sri Lanka Consulate General Office, No. 2, Street 322-B, Al Hudaiba, Dubai, UAE. Postal: PO Box 51528, Dubai, UAE.
TP. +971 4 3986535, Fax: +971 4 3984687, E Mail: dahampasaladubai@gmail.com, Web: http://www.dhahampasala.org

22. සෑම වසරක් අවසානයේ පැවැත්වෙන පරීක්ෂණයෙන් ඉහළ පන්තියට සමත්වීම සඳහා 50% ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත යුතුය. මේ සඳහා, විෂයන්ගෙන් ලබා ගන්නා ලකුණු වලට අමතරව, දිනපතා පැමිණීම, වසර පුරා පැවැත්වෙන අතිරේක ක්‍රියාකාරකම් වලට සහභාගීවීම, වෙනුවෙන් ලබා ගන්නා ලකුණුද සලකා බලනු ඇත.

සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය මගින් පනවා ඇති මෙම කොන්දේසි මාලාවට සහ විශේෂ කොන්දේසි මාලාවනට එකඟ වන බවටත්, දහම් පාසලේ දූ දරුවන් සහ දෙමාපියන් සඳහා පනවා ඇති විනය නීති මාලාව පිළිපදින බවටත්, ඉහත සඳහන් එක් කොන්දේසියක් හෝ කඩකරන පළමු අවස්ථාවේදීම දරුවාගේ දහම් පාසලේ ශිෂ්‍යභාවය අහෝසි කිරීමට දහම් පාසලේ සංවිධායක මණ්ඩලයට සහ අනුබද්ධිත දෙමාපිය කමිටුවට පූර්ණ බලය ඇති බව පිළිගන්නා අතර කිසිම කාරණයක් මත එවැනි දරුවා/දරුවන් නැවත දහම් පාසලට ඇතුළත් කර නොගන්නා බවද පිළිගනිමි. තවද මෙම ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් දහම් පාසලේ සංවිධායක මණ්ඩලයේ සහ අනුබද්ධිත දෙමාපිය කමිටුවේ තීරණ අවසන් තීරණ බවද පිළිගනිමි.

දරුවාගේ නම: ........................................................................................................................

මව / පියා / භාරකරුගේ නම: ..........................................................................................

අත්සන:.................................................................  දිනය:...........................................



Sri Lanka Consulate General Office, No. 2, Street 322-B, Al Hudaiba, Dubai, UAE. Postal: PO Box 51528, Dubai, UAE.
TP. +971 4 3986535, Fax: +971 4 3984687, E Mail: dahampasaladubai@gmail.com, Web: http://www.dhahampasala.org